ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

ප්‍රාදේශීය කාර්යාලය / பிராந்திய நிலையம் / Regional Office
දුරකථනය / தொலைபேசி / Telephone No.

දිනය / திகதி / Date: 8 ජුනි මස 2020

ජනාධිපති ලේකම්
ලේකම්/ ආරක්ෂක අමාත්‍යාංශය
පොලිස්පතිතුමන් (වැ.බ)

**<u>ඇඳිරි නීතිය පැනවීම විධිමත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයන්</u>**

කෝවිඩ්-19 අධි වසංගතය හේතුවෙන් 2020 මාර්තු මස සිට පනවන ලද ඇඳිරි නීතිය කඩකිරීම නිසාවෙන් පුද්ගලයන් බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇති බවත්, රථ වාහන රාජසන්තක කර ඇති බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (ශ්‍රී.ල.මා.හි.කො.ස / කොමිෂන් සභාව) නිරීක්ෂණය කරයි. අප රට දැනට මුහුණ පා ඇති සෞඛ්‍ය හදිසි අවස්ථාවේදී මහජන සෞඛ්‍ය සහ මහජන සාමයෙහි යහපත උදෙසා යාමට එමට ඇති නිදහස සීමා කිරීමේ අවශ්‍යතාවය කොමිෂන් සභාව පිළිගන්නා මුත් එම සීමාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් වලට අනුකූල ලෙස පනවා ඇත්ද යන්න පරීක්ෂණයට ලක් කිරීම සහ රජයට ඒ **සම්බන්ධයෙන්** අවශ්‍ය නිර්දේශයන් ලබා දීම අධීක්ෂණ ආයතනයක් ලෙස කොමිෂන් සභාවේ නීත්‍යානුකූල විෂය පථයට අනුව ඉටු කල යුතු කාර්යභාරයකි.

මෙම කාරණාව පොදු මහජනතාවගේ යහපත මත බලපෑමක් එල්ල කරන්නක් ලෙස කොමිෂන් සභාව දකියි. වර්තමාන ඇඳිරි නීතිය පනවා ඇති ආකාරයේ නීත්‍යානුකූලභාවය ප්‍රශ්න කරමින් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කොට ඇත.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 (ඇ) සහ (ඈ) වගන්තිවල විෂය පථය යටතේ කොමිෂන් සභාව විසින් විටින් විට රජයට නිර්දේශයන් යොමු කොට ඇත. 10 (ඇ) සහ (ඈ) වගන්තින් පහත සඳහන් පරිදි දක්වා ඇත:

> ඇ) නීතීන්, පරිපාලනමය නියෝග සහ ක්‍රියා පටිපාටි සම්පාදනයේදී මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමෙහිලා රජයට උපදෙස් ලබා දීම
>
> ඈ) ජාතික නීතීන් සහ පරිපාලනමය ක්‍රියාමාර්ගයන් ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් සහ ප්‍රමිතීන් හා අනුකූලභාවය තහවුරු කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිලිබඳ රජයට නිර්දේශ ලබා දීම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්තීන් හා අනුකූලතාවය තහවුරු කිරීමට 'ක්‍රියා පටිපාටි ආශ්‍රිත' පැමිණිලි විමර්ශනය කිරීමත් කොමිෂන් සභාවේ විෂය පථයට අදාළ බව කොමිෂන් සභාව සැලකිල්ලට ගනු ලැබේ (10 (අ) වගන්තිය).

මේ අවස්ථාවේදී, කොමිෂන් සභාවේ විෂය පථය යටතට ලක්වන කාරණාව වන්නේ දැනට රටෙහි පනවා ඇති ඇඳිරි නීතිය (දිවයින පුරා හෝ එහි කොටසක) පනවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් සහ එමෙන්ම ශ්‍රී ලංකාව පිළිගත් අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් වලට පටහැනි ආකාරයටද යන්න පරීක්ෂාවට ලක් කිරීමයි.

එම කාරණාවට නිසි අවධානය ලබා දීමෙන් අනතුරුව කොමිෂන් සභාව පහත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර සිටියි:

i. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රට තුල පැන නැගී ඇති සෞඛ්‍ය අර්බුදයෙහි පෙර නොවූ විරූ ස්වභාවය හේතුවෙන් ඇඳිරි නීතිය හෝ වෙනත් ආකාරයේ සීමාවන් යාමට ඒමට ඇති නිදහස මත අවශ්‍ය පරිදි පැනවීම මහජන සෞඛ්‍ය සහ මහජන සාමයෙහි යහපත උදෙසා අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව පිළිගනී.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඌ) වන වගන්තිය යටතේ සියලුම පුරවැසියන් උදෙසා තහවුරු කර ඇති යාමට ඒමට ඇති නිදහස මානව හිමිකම්හි අනෙකුත් අංගයන් හා සමීප අන්තර් සම්බන්ධතාවයක් සහිත අතිශයින්ම වැදගත් නිදහසක් වේ. එහෙත් 15 (7) වගන්තියට අනුව එම නිදහස සීමාවන්ට යටත් වේ. එම සීමාවන් ව්‍යවස්ථානුකූල වීමටනම් ඒවා මහජන සාමය සහ මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම ඇතුළු හේතූන් උදෙසා 'නීතියෙන් නියම කර යුතු' වේ. එම වගන්තිය යටතේ සීමාවන් පැනවීමේ අරමුණ උදෙසා මහජන ආරක්ෂාව පිළිබඳ දැනට පවතින නීතීන් යටතේ පනවන රෙගුලාසි ( එනම් හදිසි නීති රෙගුලාසි ) 'නීතීන්' යන්නට ඇතුලත් වේ.

*iii.* යාමට ඒමට ඇති නිදහස මත පනවන සීමාවන්, ජාතික ආරක්ෂාව උදෙසා වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (6) සහ (7) වගන්තීන්ට අනුකූල විය යුතු බව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කර ඇත. එම සීමාව නීතියෙන් පනවන ලද්දක් බව රජයට තහවුරු කල නොහැකි නම් එය යාමට ඒමට ඇති නිදහස උල්ලංඝනය කිරීමක් වේ ***(වඩිවේල් එ. සීතම්බරපුරම් ප්‍රාදේශීය පොලිස් ස්ථානය, වවුනියාව (2002) 3 ශ්‍රී.ල.නී.වා 146)***; හදිසි අවස්ථාවකදී වුවද අත්තනෝමතික ලෙස පොදු මාර්ගයන්හි ආරක්ෂක මුරපොළවල් ස්ථාපිත කිරීම යාමට ඒමට ඇති නිදහස උල්ලංඝනය කිරීමකි ***(රොද්‍රිගෝ එ ඉමල්ක, උප පොලිස් පරීක්ෂක කිරුලපන (SC (FR) No. 297/2007 S.C. Minute of 03.12.2007).***

iv. ඒ හා සමානවම, ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් යටතේද යාමට ඒමට ඇති නිදහස සීමා කල හැක්කේ නීතිය මත පදනම්ව මහජන සෞඛ්‍ය සහ මහජන සාමය ආරක්ෂා කිරීම ඇතුළු නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම උදෙසා පමණක් බව හඳුනා ගෙන ඇත (සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, 12 වන වගන්තිය). එම සීමාවන් අනෙකුත් සියලුම අයිතීන් හා සමපාත විය යුතුය. 1999 නොවැම්බර් මස 2 දිනැතිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවෙහි හැටහත් වන සැසිවාරයේදී අනුමත කරගන්නා ලද 12 වන වගන්තිය පිළිබඳ විවරණය පහත පරිදි දක්වා තිබේ:

*සීමාවක් අවසරලත් වීමටනම් එය නීතියෙන් පනවන ලද්දක් විය යුතු අතර, මෙම අරමුණ සාක්ෂාත් කිරීම උදෙසා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අත්‍යවශ්‍ය සහ සම්මුතිය මගින් හඳුනාගෙන ඇති අනෙකුත් අයිතීන් හා අනුකූල විය යුතුය* (අංක 27 දරණ විවරණයෙහි 11 වන වගන්තිය).

v. ශ්‍රී ලංකාවේ දැනට පනවා ඇති ඇඳිරි නීතිය (එනම් යාමට ඒමට ඇති නිදහස මත පනවා ඇති සීමාව) මහජන සෞඛ්‍ය පවත්වාගැනීමේ සහ මහජන සාමය කඩවීම වැලක්වීමේ අරමුණ උදෙසා බැව් පැහැදිලි වේ. එම අරමුණු ද්විත්යම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) වගන්තිය සහ අපගේ අන්තර්ජාතික වගකීම් යටතේද ආවරණය වේ.

vi. එනිසා අපගේ අවධානය යොමු විය යුතු මූලික ගැටලුව වන්නේ අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අන්තර්ජාතික වගකීම් වල අවශ්‍යතාවන්ට අනුකූලව නීති ප්‍රකාරව ඇඳිරි නීතිය පනවා ඇත්ද යන්නයි.

## vii. <u>1897 අංක 3 දරණ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනත</u>

a. දැනට බලාත්මක ඇඳිරි නීතිය පනවා ඇත්තේ 1897 අංක 3 දරණ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනත (සංශෝධිත පරිදි) යටතේ බැව් නිරීක්ෂණය වේ. එම ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ "ශ්‍රී ලංකාව තුලට රෝගයක් හඳුන්වාදීම වැලැක්වීම උදෙසා සහ ශ්‍රී ලංකාව තුල සහ ඉන් පිටත රෝගයක් පැතිරීම වැලැක්වීම සඳහා" රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට අවසරය ඇත. 2 (1) වගන්තිය යටතේ දක්වා ඇති රෙගුලාසි පැනවිය හැකි කාරණාවන් යටතට ඇඳිරි නීතිය වැනි යාමට ඒමට ඇති නිදහස මත ප්‍රබල සීමාවන් පැනවීම ඇතුලත් නොවේ. රෝගය සහ රෝග ආසාදිත පුද්ගලයන් හුදෙකලා කිරීම, එනම් ආසාදිත පුද්ගලයින් නිරෝධානය කිරීම, සඳහා පමණක් රෙගුලාසි පැනවීමට එම වගන්තිය යටතේ අවසර ඇති අතර එහි විෂය පථය සීමිත වේ.

කෝවිඩ්-19 වසංගතය පැතිරීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් මෙම ආඥා පනත යටතේ රෙගුලාසි කිහිපයක් නිකුත් කර ඇත. එහෙත් ඉන් එකදු ගමන් බිමන් මත සීමාවන් පනවා නැත. එමෙන්ම අමාත්‍යවරිය විසින් සර්වබල වගන්තියක් වන 3 (2) වගන්තිය සහ 2 වන වගන්තිය එකට කියවා රෙගුලාසි පනවා නැති බවද අප නිරීක්ෂණය කරමු.

b. අමාත්‍යවරිය විසින් 2020 මාර්තු මස 25 දිනැතිව නිකුත් කරන ලද එදිනැතිම අංක 2168/6 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත රෙගුලාසි, අනෙක් කාරණා වලට අමතරව, සෞඛ්‍ය සේවා පිලිබඳ අධ්‍යක්ෂ ජනරාල්තුමන් එම ආඥා පනත යටතේ කටයුතු උදෙසා මුළු දිවයිනටම 'නිසි බලධාරියා' ලෙස නම් කර ඇත. 2020 මාර්තු මස ගැසට් කරන ලද රෙගුලාසි (2020 මාර්තු 25 දිනැති අංක 2168/6 දරණ ගැසට් පත්‍රය) වලට අනුව නිසි බලධාරියට කිසියම් ප්‍රදේශයක් 'රෝගී ප්‍රදේශයක්' ලෙස නම් කල හැක:

> රෝගී ප්‍රදේශයක් යනු කිසියම් රෝගයකින් ආසාදිත හෝ ආසාදිත යැයි සැක කරන සහ නිසි බලධාරියා විසින් රෝගී යයි නිසි බලධාරියා විසින් ප්‍රකාශයට පත් කරන ලද කාල වකවානුවක් සඳහා රෝගී ප්‍රදේශයක් යයි නම් කරන ලද ඕනෑම ප්‍රදේශයක් වේ (2 වන රෙගුලාසිය).

c. එහෙත් මෑත කාලීන රෙගුලාසි යටතේ 'නිසි බලධාරියා' විසින් නම් කරන ලද රෝගී ප්‍රදේශයක් මත ක්‍රියාත්මක කල හැකි බලතල සඳහන් කර නොමැත. 1925 නිරෝධායන සහ රෝග වැළැක්වීමේ රෙගුලාසි (සංශෝධිත පරිදි) යටතේ නිසි බලධාරියාට, අනෙක් කරුණු අතරේ, රෝගී ප්‍රදේශයකට ඇතුල් වීම හෝ ඉන් පිටවීම වැලැක්වීමට බලතල ඇත (සාමාන්‍ය රෙගුලාසි 55 වන රෙගුලාසිය). කෝවිඩ්-19 ආසාධිත පුද්ගලයින් හඳුනාගන්න ලද නිශ්චිත ප්‍රදේශයන් ආශ්‍රිතව (උ.දා.: සුදුවැල්ල, අකුරණ, බේරුවල ප්‍රදේශයන්, වැලිසර නාවික හමුදා කඳවුර) එම බලතල ක්‍රියාවට නැංවීම අප නිරීක්ෂණය කළෙමු. නිශ්චිත ප්‍රදේශයකට අදාළ මෙම බලතල (ආසාධිත පුද්ගලයකු එම ප්‍රදේශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව) නිවාරණ ක්‍රියාමාර්ග ගැනීම උදෙසා මුළු දිවයිනටම හෝ දිස්ත්‍රික්ක කිහිපයකටම ඇඳිරි නීතිය පැනවීම උදෙසා යොදාගත හැකිද යන්න ගැටළු සහගතය. පවතින නිරෝධායන රෙගුලාසීන්හි කිසිදු ප්‍රතිපාදනයකින් නිසි බලධාරියා මත එවැනි පුළුල් බලතල පැවරීමක් යෝජනා නොවේ.

d. අනෙක් අතට, වසංගත හෝ අධි වසංගත කාලයකදී නිවාරක ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ උදෙසා රෝගී ප්‍රදේශයකින් ඔබ්බට යාම් ඊම් සීමා කිරීමේ අවශ්‍යතාවය හේතුකොටගෙන සෞඛ්‍ය බලධාරීන්ගේ උපදේශ මත පදනම්ව මහජන සෞඛ්‍ය අරමුණු උදෙසා ආඥා පනතේ 3(2) වගන්තිය යටතේ රෙගුලාසි නිකුත් කිරීම සඳහා පවරා ඇති පුළුල් බලතල අදාල බලධාරියා මත ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමේ බලය පැවරීම සඳහා අමාත්‍යවරයා විසින් ක්‍රියාවට නැංවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

3(2) වන වගන්තිය පහත පරිදි ප්‍රකාශ කර සිටියි:

> එසේ වුවද, 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පවරා ඇති බලතල වල පොදු භාවය සීමා වන ලෙස අර්ථ නිරූපණය වන *ආකාරයෙන්* මෙම වගන්තියේ කිසිවක් කිසිවිටක තේරුම් ගත නොයුතුය, එහෙත් එම බලතල මෙම ආඥා පනත යටතේ ඇති අරමුණු වඩා හොඳින් *සාක්ෂාත්* කිරීම සඳහා රෙගුලාසි පැනවිය යුතු කාරණාවන් සියල්ලටම, එම කාරණාවන් මෙම වගන්තිය යටතේ සඳහන් සියල්ලටම සමාන වුවා හෝ නොවුවාත්, විහිදී යයි.

**viii. <u>1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත</u>**

කෝවිඩ්-19 වෛරසය ශ්‍රී ලංකාවේ පැතිරීමෙන් අනතුරුව වැඩ බලන පොලිස්පතිතුමන් විසින් 'දිවයින පුරාම පොලිස් ඇඳිරි නීතිය පැනවීමේ ප්‍රකාශය' යන හිසින් යුක්ත 2020.03.20 දිනැති පහත ප්‍රකාශය නිකුත් කරන ලදී:

> *"කෝවිඩ්-19 හෙවත් නව කොරෝනා වෛරසය ව්‍යාප්තිය වැළකීම සඳහා පනවා ඇති නිරෝධායන හා රෝග වැළක්වීමේ ආඥා පනතේ විධිවිධාන හා රෙගුලාසි උල්ලංඝනය කරමින් කටයුතු කිරීම වැලැක්වීම සඳහා 2020.03.20 දින පැය 1800 සිට 2020.03.23 දින පැය 0600 දක්වා දිවයිනේ සියලු ම ප්‍රදේශ සඳහා පොලිස් ඇඳිරි නීතිය පනවනු ලැබේ."*

මෙම ප්‍රකාශය පිලිබඳ මහජනතාව දැනුවත් කරන ලද්දේ රජයේ ප්‍රවෘත්ති පිලිබඳ අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසිනි.

මාර්තු 20 වන දින සිට මේ දක්වා ඇඳිරි නීතිය සම්බන්ද ප්‍රකාශ ගණනාවක් පිලිබඳව ජනාධිපති මාධ්‍ය අංශය විසින් මහජනතාව දැනුවත් කරන ලදී. එහෙත් ජනාධිපති මාධ්‍ය අංශයේ නිවේදන හා සම්බන්ද පොලිස් ප්‍රකාශයන් ප්‍රසිද්ධියේ මහජනතාවට ලබා ගත නොහැක. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2020.05.27 දිනැතිව 2020 මාර්තු මස සිට ඇඳිරි නීතිය පිලිබඳ සියලුම පොලිස් ප්‍රකාශයන් වල පිටපත් ඒ හා සම්බන්දව සෞඛ්‍ය අධිකාරීන් විසින් කරන ලද උපදේශයන්ද සහිතව ඉල්ලා වැඩ බලන පොලිස්පතිතුමන් වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී. එහෙත් කොමිෂන් සභාවට ඒ සම්බන්දව තවමත් ප්‍රතිචාරයක් ලැබී නොමැත.

'සාමය ආරක්ෂා කිරීම' ඇතුළු තනි පොලිස් නිලධාරීන්ගේ වගකීම් 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනතේ (සංශෝධිත පරිදි) 56 වන වගන්තිය යටතේ දක්වා ඇති බව නිරීක්ෂණය කෙරේ. එහෙත් ඇඳිරි නීතිය ප්‍රකාශය කිරීමේ සාමාන්‍ය බලයක් පොලිසිය මත පැවරී නොමැති බව මෙම ආඥා පනත පූර්ණ ලෙස පරීක්ෂාවට ලක් කිරීමේදී තහවුරු වේ. පොලිස් ඇඳිරි නීතිය පැනවීම පුරුද්දක් ලෙස පමණක් විකාශය වී ඇති බව පෙනී යයි.

එහෙත් 'පොලිස් ඇඳිරි නීතිය' මත පදනම්ව ඇඳිරි නීතිය කඩ කිරීම හේතුවෙන් අත්අඩංගුවට ගැනීම් රාශියක් සහ වාහන රාජසන්තක කිරීම් ගණනාවක් පොලිසිය විසින් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

පොලිස් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන විසින් වසංගතය මැඩ පැවැත්වීම උදෙසා සෞඛ්‍ය බලධාරීන් වෙත ලබා දෙන සහය කොමිෂන් සභාව නිරන්තරයෙන් අගය කෙරේ. එහෙත් සියලුම බලධාරීන්ගේ ක්‍රියාවන් නීතියේ රාමුව තුල පිහිටීම අතිශයින්ම වැදගත් වේ.

### ix. <u>2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත</u>

මෙම පනත යටතේ 'ආපදාවක්' යන්නෙහි අර්ථ දැක්වීම තුලට 'වසංගතයක්' යන්නද ඇතුලත් වේ. එහෙත් නම් කරන ලද අධිකාරියක් විසින් ආපදා අවස්ථාවකදී ගත හැකි අතිවිශේෂ පියවර ගත හැක්කේ ජනාධිපතිතුමන් විසින් 'ආපදා අවස්ථාවක්' ප්‍රකාශයට පත් කොට එයට පාර්ලිමේන්තු අනුමැතිය ලැබුනේනම් පමණි (11 වන වගන්තිය). පාර්ලිමේන්තුව මේ වන විට රැස් නොවන බැවින් එවැනි ප්‍රකාශයන් නිකුත් කල නොහැක.

### x. <u>1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥා පනත (සංශෝධිත පරිදි)</u>

ඇඳිරි නීතිය පැනවීම සඳහා ඍජු බලතල පවරන්නේ මහජන ආරක්ෂක ආඥා පනත යටතේය (මහජන ආරක්ෂක ආඥා පනතේ III වන කොටස යටතේ වන 16 වන වගන්තිය):

16 (1) ජනාධිපතිතුමන් විසින්, ඕනෑම ප්‍රදේශයක මහජන සාමය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය යයි සැලකෙන අවස්ථාවක, ඔහු විසින් ගැසට් පත්‍රයක පල කරන ලද නියෝගයක් හරහා, එම නියෝගයෙන්ම හෝ මෙම වගන්තිය යටතේ නිකුත් කරන වෙනත් නියෝගයක් යටතේ හෝ කරන ලද නිදහස් කිරීම්වලට යටත්ව, එම ප්‍රදේශයේ කිසිදු පුද්ගලයකු, නියෝගයෙන් නියම කර ඇති කාල පරිච්ඡේදයක් තුල, පොදු පාරක, දුම්රිය මාර්ගයක, පොදු උද්‍යානයක, පොදු විනෝදාත්මක භූමියක හෝ වෙනත් පොදු භූමියක හෝ මුහුදු වෙරළක, නියෝගය යටතේ නියම කරන පුද්ගලයකුගේ අනුමැතිය රහිතව, ගැවසිය නොහැකි බවට නියෝග කල හැක…

ආඥා පනතේ III වන කොටස යටතේ ඇති බලතල ක්‍රියාවට නැංවීමේදී මහජන ආරක්ෂක ආඥා පනතේ 2 (3) වන වගන්තිය හා අනුකූල විය යුතු වුවද ඒ සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය නොවේ. මහජන ආරක්ෂක ආඥා පනතේ 21 වන වගන්තියට අනුව:

(1) 12 වන, 16 වන හෝ 17 වන වගන්තීන් යටතේ නිකුත් කරන ලද නියෝගයක්, එම නියෝගය ගැසට් පත්‍රයේ පල කරන ලද දින සිට එක් මසක කාලයක් දක්වා , එම නියෝගය ඊට පෙරාතුව අහෝසි කිරීමකට හෝ එම කාලය අවසන් වන දින හෝ ඊට ප්‍රථම නිකුත් කරන ලද නියෝගයන්ට යටත්ව, ක්‍රියාත්මකව පවතී.

(2) 2 (3) වගන්තිය යටතේ ඇති විධිවිධාන, 2 (1) වගන්තිය යටතේ ප්‍රකාශයකට අදාළ වනවා හා සාමනවම, 12වන, 16 වන සහ 17 වන වගන්තිය යටතේ නියෝගයකටද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේය.

මහජන ආරක්ෂක ආඥා පනතේ 2(3) වන වගන්තියට අනුව:

මෙම වගන්තියේ පූර්ව විධිවිධාන යටතේ ප්‍රකාශයක් කල විට ඒ පිලිබඳ වහාම පාර්ලිමේන්තුව දැනුවත් කල යුතු අතර, ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුව කල් තැබීම හෝ වාර අවසන් කිරීම නිසාවෙන් හෝ දින දහයකට වැඩි කාලයක් සඳහා වෙන් වී ඇත්නම්, දින දහයක් ඇතුලත පාර්ලිමේන්තුව කැඳවීම සඳහා ප්‍රකාශයක් නිකුත් කල යුතු අතර, ඒ අනුව පාර්ලිමේන්තුව එම ප්‍රකාශයේ සඳහන් දින රැස් විය යුතු අතර, ඉන් පසුවද, එම දිනට පාර්ලිමේන්තුව කල් තැබුනා හෝ වාර අවසන් වුවා සේ, දිගටම රැස් විය යුතුය.

(1) වන උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක්, මෙම උපවගන්තිය යටතේ සඳහන් පරිදි පාර්ලිමේන්තුව කැඳවූ විට පාර්ලිමේන්තුව රැස් නොවීම නිසාවෙන්, පාර්ලිමේන්තුව වෙත දැනුම් දීමට නොහැකි වීම එම ප්‍රකාශයේ හෝ, මෙම ආඥා පනතේ දෙවන කොටස යටතේ විධිවිධාන හෝ එම කොටස යටතේ සිදු කරන කිසිදු ක්‍රියාවක වලංගුභාවය කෙරෙහි කිසිදු ආකාරයක බලපෑමක් එල්ල නොකරයි. එසේ වුවද, එවැනි අවස්ථාවකදී හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව කැඳවිය යුතුය.

මහජන සාමය පවත්වාගැනීමේ සංකල්පය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මහජන නොසන්සුන්තාවය වැලැක්වීම ලෙස හඳුනාගෙන ඇත. පුළුල් ලෙස ව්‍යාප්ත සාමය සහ සන්සුන්බව කඩවීම් මහජන නොසන්සුන්තාවයට හේතු වේ. 'නීතිය හා සාමය' කඩවීමත් 'මහජන සාමය' කඩවීමත් අතර වෙනස හඳුනාගෙන ඇති ඉන්දියානු නඩු තීන්දු නීතිය පුළුල්ව සඳහන් කරමින් අප ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 'මහජන සාමය' යනු මහජන

සමනය, ආරක්ෂාව සහ සන්සුන්බව හා සමගාමීවන පටු සංකල්පය බව තීන්දු කර ඇත ***(සිරිවර්දන එ. ලියනගේ (1983) 2 ශ්‍රී.ල.නී.වා. 164, විමලරත්න විනිසුරුතුමන්ට අනුව).***

මහජනතාව අතර ඇති බිය සහ අනාරක්ෂිත බව හේතුවෙන් වර්තමාන වසංගතය වැනි බරපතල සෞඛ්‍ය අර්බුද මහජන නොසන්සුන්තාවය පිලිබඳ ගැටළු වලට මග පාදයි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සඳහන් කර ඇති මහජන සාමය පිලිබඳ සංකල්පය වර්තමාන තත්වයට බෙහෙවින් අදාළ වේ. මාරාන්තික රෝගයක් පැතිරීමෙන් මහජනතාව ආරක්ෂා කිරීම, රෝග මූලාශ්‍රය පිලිබඳ මහජනතාවගේ සැකය සහ බිය හේතුවෙන් ඇතිවන ප්‍රචණ්ඩත්වය සහ එදිරිවාදීභව වැලැක්වීම ආදින් සියල්ලම යාම් ඊම් නිදහස කෙරෙහි පනවන ලද සීමාවන් සාධාරණීකරණය කරනු ලැබේ.

ඒ හා සමානවම, කාර්ය පටිපාටික දෘෂ්ඨිකෝණයකින් ගත් කල, පසු ගිය වසරේ අප්‍රේල් මස 21 වන දිනැතිව දියත් කල බෝම්බ ප්‍රහාර වලින් පසුව සිට ජනාධිපතිතුමන් විසින් මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වන වගන්තිය යටතේ සියලුම දිස්ත්‍රික්කවල මහජන සාමය පවත්වාගැනීම සඳහා සන්නද්ධ හමුදා යොදාගැනීමට නියෝග කිරීමට එම පනතේ III වන කොටස යටතේ ඇති බලතල භාවිත කර ඇති බව නිරීක්ෂණය වේ. ජනාධිපති නියෝගය සෑම මසකම අලුත් කර ගැසට් කරන අතර ඉතාමත් මෑතදී පනවන ලද නියෝගය 2020 මැයි 21 දිනැති 2176/17 අංක දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත.

## xi. <u>නිර්දේශයන්</u>

a. මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම උදෙසා 1996 අංක 21 දරණ පනතෙන් පවරා ඇති බලතල යටතේ කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද නිර්දේශයන් මෙසේ වේ.

වර්තමානයේදී මුළු රටම වෙලාගෙන ඇති ආකාරයේ අර්බුධයකදී මහජන සෞඛ්‍ය සහ මහජන සාමයේ යහපත උදෙසා යාමට ඒමට ඇති නිදහස මත සීමාවන් පැනවීම (එනම් ඇඳිරි නීතිය සහ ආසාධිත ප්‍රදේශය ඇතුළතට යාම් ඊම් සීමා කිරීම) දැඩි අත්‍යවශ්‍යතාවයක් බව කොමිෂන් සභාව නැවතත් අවධාරණය කර සිටියි. එහෙත් එම සීමාවන් නීතියේ ආධිපත්‍යයට පටහැනි විය නොහැක. යාමට ඒමට ඇති නිදහස මත පනවන සීමාවන් නීත්‍යානුකූල වන්නේ අවසරලත් අරමුණු උදෙසා නීතියෙන් පනවන්නේනම් පමණක් බව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අන්තර්ජාතික වගකීම් යටතේද නියම කර ඇත. මහජන සෞඛ්‍ය සහ මජන සාමය ආරක්ෂා කිරීම අවසරලත් අරමුණු වේ. මෙම නිර්දේශයන් විසින් විසඳන මූලික ගැටලුව වන්නේ එම සීමාවන් නීතියෙන් පැනවිය යුතු ආකාරයයි.

ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීම දෙආකාරයකින් විධිමත් කල හැකි බව කොමිෂන් සභාවේ මතයයි:

i. මහජන ආරක්ෂක ආඥා පනතේ 16 වගන්තිය යටතේ ගැසට් කරන ලද ජනාධිපති නියෝගයක් - මෙය ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කල හැකි වඩාත්ම බලාධිකාරී ආකාරය වේ. වසංගත අවධියකදී තීරණාත්මක ක්‍රියාවන් අවශ්‍ය කරයි; යාමට ඒමට ඇති නිදහස මත දිගින් දිගටම සීමාවන් පැනවීම හේතුවෙන් මහජනතාවගේ අයිතීන් කොතෙක් දුරට බලපෑමට ලක් වෙනවාද යන්න සලකා බැලීමේදීද මෙම 16වන වගන්තිය යටතේ ඇඳිරි නීතිය පැනවීම සුදුසුම විකල්පය බව පෙනී යයි. 16 වන වගන්තිය යටතේ ඇති බලය යෙදවීම සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය නැති බවද සඳහන් කල යුතු වේ.

ii. අමාත්‍යවරයා විසින් නිරෝධායන සහ රෝග වැළක්වීමේ ආඥා පනතේ 2 සහ 3 (2) වන වගන්ති යටතේ පනවන රෙගුලාසි. අමාත්‍යවරයා විසින් පත් කරන 'නිසි බලධාරියා' විසින් යාමට ඒමට ඇති නිදහස සීමා කල හැක්කේ ආසාදිත ප්‍රදේශයක් තුල පමණි. එම වගන්තීන් යටතේ පැවරෙන බලය, පූර්වාරක්ෂක පියවරක් ලෙස දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීමට තරම් ප්‍රමාණවත් නොවේ.

b. ඇඳිරි නීතිය සහ යාමට ඒමට නිදහසට පනවා ඇති සියලුම සීමාවන් ප්‍රකාශයට පත් කිරීම විනිවිධභාවයෙන් යුක්ත වීම අත්‍යවශ්‍ය වේ. ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීම් විධිමත්ව සිදු කල යුතු අතර එම නිල ප්‍රකාශයන් ප්‍රසිද්ධ කල යුතු වේ. දැනට, ඇඳිරි නීතිය පැනවීම සහ ඉවත් කිරීම ජනාධිපති මාධ්‍ය අංශය විසින් නිවේදනය කරයි. ඇඳිරි නීතිය දැනට ප්‍රකාශයට පත් කර ඇත්තේ පොලිසිය විසින් නිරෝධායන සහ රෝග වැළක්වීමේ ආඥා පනත යටතේ බව අපට අඟවා ඇති නමුදු එම ප්‍රකාශයන් ප්‍රසිද්ධියේ ලබා ගත නොහැක.

මෙම නිර්දේශයන් කිසිවක් මහජන සෞඛ්‍ය අධිකාරීන් විසින් කෝවිඩ්-19 වසංගතය ආශ්‍රිතව නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන් වලට පටහැනිව කටයුතු කිරීම සඳහා හෝ පොදුවේ මහජන සෞඛ්‍යයට හානිකර ආකාරයෙන් කටයුතු කිරීම සඳහා මහජනතාව විසින් අර්ථ නිරූපනය කල නොයුතු බව කොමිෂන් සභාව අවධාරණය කරනු ලැබේ.

සභාපතිනිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්: ගරු නීතිපතිතුමන්
ලේකම්/සෞඛ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල්/ සෞඛ්‍ය සේවා